සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**06 ශ්‍රේණිය** | තෙවන වාර පරීක්ෂණය - 2022(2023) | **21 S**

නම: .............................................

**සිංහල භාෂාව හා සාහිත්‍යය** | **කාලය පැය දෙකයි**

## I කොටස

උපදෙස්

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

**අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. නූතන සිංහල අක්ෂර මාලාව ප්‍රධාන වශයෙන් කොටස්,
    (1) 2 කි.   (2) 4 කි.   (3) 6 කි.   (4) 3 කි.

02. හල් කළ නොහැකි ව්‍යඤ්ජන අක්ෂරයක් වන්නේ,
    (1) ධ ය.   (2) ම ය.   (3) (අ)ඃ ය.   (4) ව ය.

03. ප්‍රථම පුරුෂ ඒකවචන අතීත කාල ස්ත්‍රී ලිංග ක්‍රියා පදය යටින් ඉරක් අඳින්න.
    (1) දිවුවෝ ය.   (2) දිවුවේ ය.   (3) දිවූහ.   (4) දිවුවා ය.

04. අනුක්ත නාම පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    (1) මම, අප, ගුරුවරු   (2) ඔවුන්, තෝ, ළමයින්
    (3) දැරියක, ගොවියෙකු, තොප   (4) මා, හාවා, මිනිස්සු

05. මහප්‍රාණ අක්ෂරයක් රහිත පිළිතුර තෝරන්න.
    (1) පීඨය   (2) කඩය   (3) ස්ථාන   (4) සංඛ

**අංක 06 හා 07 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු වචනය තෝරන්න.**

06. (1) ස්ථාවර   (2) ප්‍රථිපත්තිය   (3) පුෂ්පය   (4) කුඨය

07. (1) පරික්සනය   (2) අවබෝදය   (3) දක්ෂිණ   (4) මහළු

**අංක 08 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති වාක්‍යයේ ඉරි ඇඳි පදයට සමානාර්ථවත් පදය තෝරන්න.**

08. ඔහු ජයග්‍රහණයේ <u>කිරුළ</u> පැළඳ ගන්නේ ය.
    (1) මාලය   (2) පදක්කම   (3) කුසලානය   (4) ඔටුන්න

09. ළමයි <u>කැලය</u> තුළට ප්‍රවේශ වූහ.
    (1) ලැහැබ   (2) වනය   (3) ආරාම   (4) කුටිය

10. කෘෂිකර්මාන්තයට <u>ජලය</u> අත්‍යවශ්‍ය සාධකයෙකි.
    (1) පොහොර   (2) පස   (3) උදක   (4) වැව

**අංක 11 හා 12 ප්‍රශ්නවල දී ඇති පදයට විරුද්ධාර්ථවත් පදය තිත් ඉර මත ලියන්න.**

11. දිළිඳු - ........................................

12. විවිධත්වය - ........................................



LIVEWORKSHEETS

**අංක 13 හා 14 ප්‍රශ්නවලට පහත දී ඇති වාක්‍ය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

දක්ෂ පොලිස් නිලධාරීහු අනතුර සිදු වූ ස්ථානයට ඉක්මණින් ළඟා වූහ.

13. ඉහත වාක්‍යයේ සඳහන් ක්‍රියා විශේෂණ පදය ලියන්න..........................................

14. ඉහත වාක්‍යයේ ඇති නාම විශේෂණ පදය නාම පදය සමඟම උපුටා ලියන්න. .................................

**අංක 15 සිට 19 තෙක් ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර පහත ඇති වචනවලින් තෝරා ලියන්න.**

15. තුරු පෙළ මඟ දෙපස සෙවණ ..........................................................

16. කුරුලු රංචුව ඇතට පියාසර ..........................................................

17. .......................................................... කුඹුරට ගියාය.

18. .......................................................... පාර පිරිසිදු කළේ ය.

19. .......................................................... සුවඳ විහිදුවමින් පිපී වැනෙති.

( ගොවියෝ, කරයි, පුෂ්ප, කරති, ගෙවිලිය, කම්කරුවා, පුෂ්පයෝ, කළේ ය.)

20. පහත වාක්‍ය නිවැරදි ව පද බෙදා විරාම ලක්ෂණ යොදා නැවත තිත් ඉර මත ලියන්න.
තාත්තේරාමුහිසකියන්නේමොකද්දමල්ලිවිමසුවේය

..........................................................................................................................................................

..........................................................................................................................................................

(ල : 2x20=40)



LIVEWORKSHEETS